# උගෙනිති කුමර කුමරියෝ

## රුකුල් දෙන සිප් හලක්

ධනය සඳහා රසායනික බෙහෙත් ද්‍රව්‍ය භාවිතා කිරීමද පිළිබඳ පුහුණුවද ලබා දීම එයට ඇතුළත් වෙනවා.

ප්‍රශ්නය: මෙම පුහුණු මධ්‍යස්ථානයෙහි සිසුන් කොපමණ පුහුණු වෙනවාද?

පිළිතුර: 1977 දී මෙම මධ්‍යස්ථානය ජාතික තරුණ සේවා සභාව යටතට ගැනීමෙන් පසුව සිසුන් අති ශාල සංඛ්‍යාවක් පුහුණු කර ඇත. දැනට මෙහි තරුණ තරුණියන් 40 ක් පමණ පුහුණු වෙනවා. ඔවුන් බොහෝ දෙනෙක් කෑගල්ල දිස්ත්‍රික්කයේ පදිංචි කරුවන් වන අතර මෙම ආයතනයේ නේවාසිකව පුහුණුව ලබා ගනිති.

ප්‍රශ්නය: පුහුණුවන්නන් තෝරා ගන්නා ආකාරය...?

පිළිතුර: මෙම පුහුණුව ලබා දීමේදී අරමුණු වන්නේ සත්‍ය වශයෙන්ම සත්ත්ව පාලනය සිය ජීවන වෘත්තිය කර ගැනීමට කැමැති තරුණ තරුණියන් තෝරා ඔවුන්ට අත දීමටයි. මේ නිසා තරුණ පරපුරට අයත් (වයස 17 ත් 29ත් අතර) කෙනෙකුට මෙම ආයතනයෙන් පුහුණුව ලබා ගත හැකියි. මේ සඳහා නියම සුදුස්සන් තෝරා ගැනීමට පහසු වෙනු පිණිස පුහුණු අපේක්ෂකයින්ගේ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව පවා දැඩි ලෙස සලකන්නේ නැහැ. එහි තේරුම නම් සෑහෙන අධ්‍යාපනයක් නොමැති තරුණයෙකුට හෝ තරුණියකට වුවද මෙම ආයතනයෙන් පුහුණුව ලබා ගත හැකියි. නමුත් එලෙස පුහුණුව අපේක්ෂා කරන්නා සත්‍ය ලෙසින්ම සත්ත්ව පාලනයට කැමතිද ඔහුට හෝ ඇයට ඒ සඳහා මූලික පහසුකම් තිබේද වැනි කරුණු සොයා බලනවා.

ප්‍රශ්නය: පුහුණුවක් ලබා දෙන්නේ නොමිලේද?

පිළිතුර: ඔව්. එපමණක් නොවේ. ආහාර සපයා පුහුණුව ලබන කාලයේදී සුළු දීමනාවකුත් පුහුණුවන්නාට ලබා දෙනවා. ඒ හැර සාර්ථකව පුහුණුව නිමකරන්නට දිනක් වයසැති කුකුල් පැටවුන් 50 ක් හෝ ඌරු පැටව් ජෝඩුවක් හෝ නොමිලයේ සපයනවා.

සත්ත්ව ගොවිපලවල් ආරම්භ කර තිබෙනවා. ඔවුන් එය සිය ජීවන වෘත්තිය කරගෙන තිබෙනවා පමණක් නොව, සත්ත්ව පාලනය පිළිබඳ සිය ගමේ වැසියන්ට ආදර්ශ හා උපදෙස් සපයන්නන් බවටත් පත්වෙලා තිබෙනවා. මේ හැර මෙම මධ්‍යස්ථානය ආරම්භ වීමෙන් පසුව මෙය වටේම වලල්ලක් මෙන් ගම් වැසියන්ගේ කුඩා පරිමාණයේ සත්ත්ව ගොවිපලවල් රාශියක් බිහිවී තිබෙනවා.

---

**මෙම පුහුණුව ලබා දීමේදී අරමුණු වන්නේ සත්‍ය වශයෙන්ම සත්ත්ව පාලනය සිය ජීවන වෘත්තිය කර ගැනීමට කැමැති තරුණ තරුණියන් තෝරා ඔවුන්ට අත දීමටයි. මේ නිසා තරුණ පරපුරට අයත් (වයස 17 ත් 29 ත් අතර) කෙනෙකුට මෙම ආයතනයෙන් පුහුණුව ලබාගත හැකියි. මේ සඳහා නියම සුදුස්සන් තෝරා ගැනීමට පහසු වෙනු පිණිස පුහුණු අපේක්ෂකයිනගේ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව පවා දැඩි ලෙස සලකන්නේ නැහැ.**

---

ප්‍රශ්නය: මෙහි විවිධ පාඨමාලා තිබේද?

පිළිතුර: ඔව්. එම පාඨමාලාවට සහභාගිවන්නන්ගේ අවශ්‍යතා අනුව විවිධ මාදිලියේ පාඨමාලා පැවැත් වෙනවා. කාල සීමා අනුව නම් මාස දෙකේ සිට මාස 6 දක්වා විවිධ පාඨමාලා පැවැත්වෙනවා.

ප්‍රශ්නය: මෙයට පෙර පුහුණුව ලැබූ තරුණ තරුණියන් දැන් සත්‍ය වශයෙන්ම සත්ත්ව පාලනයේ නිරත වෙනවාද?

පිළිතුරු; ඔව්. පැරණි පුහුණු වන්නන් සෑම දෙනාම පාහේ දැන්

ප්‍රශ්නය: ගැමි තරුණ තරුණියන් රාශියකට සත්ත්ව පාලන අධ්‍යාපනය ලබාදුන් කෙනෙකු ලෙස ඔබට ඇති අත්දැකීම අනුව සත්ත්ව පාලනයෙහි නිරතවන ගැමි තරුණයෙකුට බලපාන ප්‍රධානතම ප්‍රශ්නය කුමක්ද?

පිළිතුර: ගැමි තරුණයෙකුට ප්‍රශ්න රාශියකට මුහුණ දීමට සිදුවී තිබෙනවා. ඉන් ප්‍රධානතම ප්‍රශ්නය වන්නේ රසායනික බෙහෙත් ද්‍රව්‍ය හා සත්ත්ව ආහාර ලබා ගැනීමේ අපහසුවයැයි ඔවුන් පවසනවා...

# කුමරියන් හට තක්සලාවක්

සත්ත්ව පාලනය සිය ජීවන වෘත්තිය කර ගැනීමට බලාපොරොත්තු වන තරුණ පරපුර වෙනුවෙන් සේවයට කැපවූ පෞද්ගලික අංශයේ ආයතන ගණනාවක්ද මෙරටෙහි තිබේ. එයින් තරුණයන් වෙනුවෙන් විශේෂයෙන් වෙන්වුන ප්‍රමුඛ ආයතනයක් වන හංවැල්ලේ හිග්ගස්හේනේ යහපත් එඬේරා මධ්‍යස්ථානය නැරඹීමට ගොවි ජනතාව නියෝජිත පිරිසක් පසු ගියදා එහි ගියහ. විශාල ප්‍රමාණයේ කුකුල් කොටුවකින්ද, ගව, ඌරු පට්ටිවලින්ද, සේද කර්මාන්ත මධ්‍යස්ථානයක් හා ආදර්ශ ගොවි පලකින්ද සමන්විත අක්කර 180ක දර්ශනීය භූමි භාගයක පිහිටා ඇති මෙම ගොවි මධ්‍යස්ථානයේ විදුහල්පතිනි මාරි ජොසපින් සහෝදරිය හමුවීමට එම නියෝජිත පිරිසට අවස්ථාව ලැබිණ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කුණ්ඩසාලයේ කෘෂිකර්ම විද්‍යාලයෙන් ඩිප්ලෝමා ලබාගත් පළමුවන කන්‍යා සහෝදරිය වන ජොසපින් සහෝදරිය සත්ත්ව පාලනයේත් එම අධ්‍යාපනයේත් පුරෝගාමීවූ සොහොයුරියක් ලෙස සැළකේ. එම සාකච්ඡාවේදී උපුටා ගත් කොටස් මෙහි පළවේ.

ප්‍රශ්ණය : මෙරටේ සත්ත්ව පාලන කටයුතු වලදී වඩාත් ලාභ දායක අංශය ලෙස ඔබ සලකන අංශය ?

පිළිතුර : අපේ රටේ හැටියට, විශාල ප්‍රමාණයේ එනම් විශාල මූල ධනයක් වැය කර ආරම්භ කළ සත්ත්ව ගොවිපලක් වන අප ආයතනයේ වැඩියෙන්ම ලාභ ලැබෙන්නේ ඌරු පාලනයෙන් යැයි කියන්නට පුළුවන්. එයට හේතු වී ඇත්තේ මෙම වර්ගයේ සත්ත්ව පාලනයට වැඩි නඩත්තු වියදමක් දැරීමට නොමැතිවීමත් ඉතා සුළු කලකදී ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවීමත් ලෙස සලකන්න පුළුවන්. අනෙක් අතින් බෙහෙත් ද්‍රව්‍ය ආදිය සඳහාද විශාල වියදමක් දැරීමට සිදු නොවේ. මෙම තත්වය සුළු පරිමානයේ ඌරු කොටුවක් පිළිබඳව වුවද සත්‍ය යැයි කියන්න පුළුවන්.

ප්‍රශ්ණය : සත්ව පාලනය සිය ජීවන වෘත්තිය කර ගැනීමට බලාපොරොත්තු වන තරුණ තරුණියන්ට එලෙස ආරම්භ කිරීමට සුදුසු සත්ත්ව පාලන ක්‍රමය ලෙස ඔබ සළකන්නේ කුමක්ද ?

පිළිතුර: යම් කිසිවෙකු සත්ත්ව පාලනය ජීවන වෘත්තිය කර ගැනුමට බලාපොරොත්තුවෙන් එය අරඹනවා නම් මූලික කරුණු කිහිපයක් ගැන සලකා බැලිය යුතු වෙනවා. පළමුවෙන් එම ව්‍යාපාරය සඳහා තමා යොදන සම්පත් ප්‍රමාණය. බොහෝ දෙනෙකුට කිසිදු ව්‍යාපාරයක් සඳහා ආරම්භයේදී ඉතා විශාල මුදලක් යෙදවීමට අපහසුයි. අත්දැකීම් රහිතව විශාල මුදලක් යෙදවීම නුවනට හුරුත් නැ. අනෙක් අතින් එම ව්‍යාපාරය ඉක්මණින් ආදායම් ලැබෙන්නක්ද විය යුතුයි. එමෙන්ම එහි අවදානම් සහිත බව අඩුවිය යුතු අතර වෙළෙඳ පහසුකම් සහිත එකකුත් විය යුතුය. මේ කරුණු සළකා බැලීමේදී කුකුල් පාලනය එවැනි ආරම්භයක් සඳහා සුදුසු සත්ත්ව පාලනය ලෙස මා විස්වාස කරනවා. අප ආයතනයේ පුහුණුව ලැබූ බොහෝ දෙනෙකු කුකුල් පාලනයට මනා අවධානයක් යොමු කර තිබෙන්නේ මේ හේතු නිසා යැයි මා විශ්වාස කරනවා.

ප්‍රශ්ණය : වර්ෂ දශක ගණනාවක් තිස්සේ පැවැත්වෙන විශාල ප්‍රමාණයේ සත්ත්ව පාලන ආයතනයක අධිපතිනිය වශයෙන් මෙම ආයතනයට අලෙවි කිරීමේදී යම් ගැටලුවකට මුහුණ දීමට සිදුව තිබේදැයි පවසනවාද ?

පිළිතුර : එවැනි කිසිත් ගැටලුවක් අප ආයතනයට නම් නැහැ. වර්ෂ ගණනාවක් තිස්සේ අප ආයතනය මනා ලෙස සංවිධානය වී මනා වෙළෙඳ සබඳතා ඇති නිසාදෝ අපට නම් එවැනි අවහිරයක් නෑ. අප නියම කෙරෙන මිළට බිත්තර, ඌරු මස් ආදිය වෙළෙඳුන් මිළයට ගන්නවා. කිරි විකිණීම සඳහා වුවද අපට නම් වෙළෙඳුන් සොයා ගත හැකියි.

ප්‍රශ්ණය : සත්ත්ව පාලනයට තරුණ තරුණියන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙල ගැන අපි දැන ගැනීමට කැමතියි.

පිළිතුර : 1965 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම වැඩ පිළිවෙල අනුව දැනට තරුණ තරුණියන් 1000 ක් පමණ අප ආයතනයෙන් පුහුණුව ලබා සිටිති. වර්ෂ 2ක කාලයක් තිස්සේ පැවැත්වෙන මෙම ඩිප්ලෝමා පාඨමාලාවට එක් වරකදී ශිෂ්‍යයාවන් 60 කුත්, ශිෂ්‍යයන් 15 දෙනෙකුත් බඳවා ගන්නවා. එම පාඨමාලාව කුකුල් පාලනය, ගව පාලනය, ඌරු පාලනය හා කෘෂිකර්මය යනුවෙන් කොටස් හතරකට බෙදා එක් කොටසකට 6 මාසය බැගින් සකස්ව තිබෙනවා. මෙම පාඨමාලාව නේවාසික එකක් නිසා සියලුම පුහුණුවන්නන් මෙම ආයතනයේම නැවතී සිටිය යුතු වෙනවා.

ප්‍රශ්ණය : පුහුණුවන්නන් බඳවා ගැනීම ?

පිළිතුර : එය කෙරෙන්නේ පුවත් පත් දැන්වීම් මගිනුයි. ඒ සඳහා අ.පො.ස. (සා) පෙළ සමත්විය යුතු නමුත් අපේ පුහුණුවන්නන් බොහෝ දෙනෙක් උසස් පෙළ පවා සමත්.



මේරි ජොසපින් සහෝදරිය

මෙම පාඨමාලාව පැවැත්වෙන්නේ ඉතා සහනාධාර ක්‍රමයකට. බොහෝ කාලයක් නොමිලයේ පවත්වාගෙන ආ මෙම පාඨමාලාවට දැන් පුහුණු වන්නෙකුගෙන් මාසයකට රුපියල් 25ක් වැනි සුළු මුදලක් අය කරනවා.

ප්‍රශ්ණය : පුහුණු වන්නන්ට වෙනත් පහසුකම් සලසාදී තිබේද ?

පිළිතුර : ඔව්. ඔවුන් අංග සම්පූර්ණ පුරවැසියන් කරන්න අපි සෑම උත්සාහයක්ම කරනවා. තරුණියන්ම සත්ව පාලනය හැරුණවිට, ගෘහ විද්‍යාව, ඉංග්‍රීසි, නැටුම් ආදී පන්ති පවත්නෙවා. එමෙන්ම ආයතනයේ තරුණ ගොවි සමාජයද ඉතා ක්‍රියාකාරී එකක්. මේ හැරුණු විට පුහුණුව සාර්ථකව නිම කරන කෙනෙකුට සත්ත්ව පාලන ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා 3% ක් වැනි ඉතාම සුළු පොලියකට රුපියල් 15,000 ක් ණය මුදලක්ද අවයතනය සපයනවා.

ප්‍රශ්ණය : දැනට සාර්ථක සත්ත්ව පාලන ව්‍යාපාරිකයන් බවට පත්වී ඇති ඔබේ පැරණි පුහුණු වන්නන් පවසන අන්දමට ඔවුන්ට ඇති ප්‍රධාන ගැටළුව කුමක්ද ?

පිළිතුර : සිය නිෂ්පාදන අලෙවි කිරීමට පහසුකම් නැතිවීම ඔවුන්ගේ ප්‍රධානතම ගැටළුවයි.........